# JUSTICE FOR ALL

අප්‍රේල් 3, 2023

#RepealPTA

#NoToATA

#ProtectDemocracy

1979 අංක 15 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත (PTA) අපේ ව්‍යවස්ථාපිත පොත් වල ඇති ඉතාම කුරිරු නීති සම්පාදනය ලෙස පවතී. 1979 ජූලි මාසයේදී තාවකාලික විධිවිධාන පනතක් ලෙස සම්මත කරන ලද අතර, මාතෘකාවෙන් වෙන් ව ඇගවෙන්නේ මස 06 ක් වන අතර, එය බොහෝ දෙනෙකුට අසාධාරණයක්, දුක්ඛිත හා දුෂ්කරතා ඇති කරමින් දිගු වසර 44 ක් සමෘදිමත් වී ඇත. සැමට යුක්තිය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම සදහා දීප ව්‍යාප්ත ව්‍යාපාරයක් සමග උද්ඝෝෂනය කළ අතර එය අවලංගු කිරීම සදහා දැවැන්ත මහජන සහයෝගයක් ලබා ගත්තේය.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඉවත් කර ඒ වෙනුවට ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූලව නීතියක් ගෙන ඒමට ශ්‍රී ලංකා රජය පොරොන්දු විය. "ත්‍රස්තවාදයට එරෙහි පනත" (ATA) නමින් පනත් කෙටුම්පතක් දැන් ගැසට් කර ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ ආදිපත්‍ය සහ වගකිව යුතු රජය සදහා ආපසු හැරවිය නොහැකි ප්‍රතිවිපාක ඇති ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට වඩා ශ්‍රී ලාංකික ජනතාවගේ අයිතිවාසිකම් සහ නිදහස අහිමි කිරීමට යෝජිත ඕ (ATA) හි විෂය පාඨය සහ හැකියාව බොහවින් නරකය. බලාත්මක කිරීම ශ්‍රී ලංකාව පොලිස් රාජ්‍යක් බවට පරිවර්ථනය කරනු ඇති අතර මිනිසුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ, සංගමයේ සහ සාමකාමී විරෝධතාවයේ මූලික අයිතිවාසිකම් කොල්ලකනු ඇත. (ATA) හි මර්ධනකාරී ස්වාභාවය සැලකිල්ලට ගනිමින්, එය පරීක්ෂාවට ලක්කල යුතු අතර, ශක්තිමත් ලෙස විවාදයට අභියෝග කළ යුතුයි.

දැනුවත් කිරීමේ සහ නිර්මාණාත්මක නියැලීමේ ආත්මය තුළ (ATA) අභියෝග කිරීමේ ක්‍රම සාකච්චා කිරීමට සහ ගවේශණය කිරීමට සිදුවීම් මාලාවක් සංවිධානය කෙරේ. 2023 අප්‍රේල් 06 වැනි බ්‍රහස්පතින්දා සවස 3 ට ශ්‍රී ලංකා පදනම් ආයතනයේ **(SLFI)** පැවැත්වෙන මේ සම්බන්ධ සම්මන්ත්‍රණයකට ඔබට ආරාධනා.

මෙම අවස්ථාවට ඔබගේ සහභාගීත්වය අපි අගය කරමු.

එම් ඒ සුමන්තිරම්

කැදවුම්කරු